
# ලොකුම වැරද්ද



ඔනාදි තිසාමා නවරත්න

# ලොකුම වැරැද්ද

ඔනාදී තිසාමා නවරත්න

## ලොකුම වැරැද්ද

ඔනාදී තිසාමා නවරත්න

99B/2 උඩ ඊරියගම, පේරාදෙණිය.

**චිත්‍ර**

ඔනාදී තිසාමා නවරත්න

**ISBN 978-624-206-663-9**

## කතෘගේ වෙනත් කෘති

- ඔලීනාට තෑග්ගක්
- ඔල්ගා ගේ සිහිනය
- අපූරු ගමන
- Mother Earth smiled at Olumalee
- Enchanted Present
- Little Olga's dream

**ප්‍රකාශක** - මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**කෘතිය එළිදක්වන දිනය** 2023-11-15

# පිදුම

**මගේ සියලු දුක සැප බලන**

**මගේ ආදර අප්පච්චිට හා අම්මාට**

**මේම පොත පුදමි.**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැඟීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයප්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01



එකමත් එක ගමක පුංචි ගැහැණු ළමයෙක් හිටියා. එයාගේ නම ඕලුමලී. ඕලුමලී ගස්වැල් වලටත් පුංචි කුරුල්ලන්ගේ කිචි බිචි යටත් ගොඩක් ආදරය කළා.

ඕලුමලී ගමේ සිටියත් ඇය ගියේ නගරයේ පාසලට. නගරය මිනිසුන්ගෙන්, වාහනවලින් ශබ්දවලින් වගේ ම අපිරිසිදු වාතයෙන්නුත් පිරිල තිබුණා. ඕලුමලීගේ පාසලේ ළමයි මේ අපිරිසිදු වාතය නිසා නිතර ම ලෙඩ උණා.

ඉතින් දවසක් ඕලුමලීට හිතුනා අපේ ලස්සන පරිසරය විනාශ කරන්න මිනිසුන් කරන ලොකු ම වැරැද්ද හොයන්න.

ඉතින් උදේ පාසැල් යන විටත්, පාසලේදීත්, සෙල්ලම් මිදුලේදීත් ඕලුමලී පරිසරය විනාශ කරන්න මිනිසුන් කරන ලොකු ම වැරැද්ද ගැන හිතුවා.



දවසක් උදෑසනින් පාසැල් ආපු ඕලුමලී පාසලේ ඉදිරි පසම තිබුණු ලොකු සියඹලා ගස එතැන බිම කපල දමා තිබෙන හැටි දැක්කා.

"අනේ! කුරුලු කූඩුවක් බිම වැටිලා" ඕලුමලීට කියැවුණා.

වනාන්තර කපලා විනාශ කරන එක අපිට වගේ ම සතුන්ටත් කරදරයක්. මොකද සතුන් ජීවත් වෙන්නේ වනාන්තරවල නේ.


ZZZZZZZZ

“ වනාන්තර නිසා පිරිසිදු ජලයත්, වාතයත් අපිට ලැබෙනවා” දවසක් ගුරුතුමී පරිසරය පාඩමට කියා දුන් හැටි ඕලුමලීට මතක් උණා.



ඒ වගේ ම ගස්වැල්වලින් අපිරිසුදු වාතය පිරිසිදු කරන බව අප්පච්චිත් ඇයට කියා තිබුණා.

ගස්වැල් විනාශ කරන එක මිනිසා පරිසරයට කරන ලොකු ම වැරැද්ද කියලා ඕලුමලී තේරුම් ගත්තා.



ඒ වගේ ම ගස් වැල් නැති උනොත් අපිරිසුදු වාතය පිරිසිදු කරන්නේ කවුද? අපිරිසිදු වාතයෙන් අපේ පරිසරය පිරිලා.

ඉතින් ඕලුමලී එයාගෙ ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගත්තා.

ඕලුමලීගේ හත් වෙනි උපන්දිනයට තිබුනේ තව සතිය යි.

“ අද මම පැලයක් සිටු වුවොත් ඒ පැලය ලොකු ගසක් වෙන්න තව අවුරුදු කීයක් යයි ද?” ඇය අප්පච්චීගෙන් ඇසුවා.

“ අවුරුදු දහයක් වත් යයි දූවේ, ඇයි මගේ දූව එහෙම ඇහුවේ?” අප්පච්චි ඇහුවා.




“ මගේ උපන්දිනයට පැළ හදන්න ඕනේ” ඕලුමලී හිත හිතා හිටපු අදහස අප්පච්චිට කිව්වා.

“ හා, ඒක හොඳ අදහසක්...ම්...ම්... කොහෙද අපි පැළ හිටවන්නේ?” අප්පච්චි ඇහුවා.

“මේ පරිසරය විනාශ වෙන එක නවත්තන්න නම් අපි හැමෝම ගස් වවන්න පුරුදු වෙන්න ඕනේ.

ඒ නිසා මම මගේ පන්තියේ හැම යහළුවෙක්ට ම අඹ පැළයක් තෑගි දෙනවා... ගෙදර ගිහින් පැළ කරන්න...

ඉතින් එතකොට අපේ පරිසරය විනාශ වෙන එකක් නැහැ.” ඕලුමලී කිව්වා.



මිනිසා පරිසරයට කරන ලොකු ම වැරැද්ද නිවැරදි කරන්න එක් වෙන්න පුලුවන් වුණ එක ගැන ඕලුමලීට ලොකු සතුටක් දැණුනා.

නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

**සෙනෙවිරත්න මහලේකම්**

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023 . 11 . 01**